එක්සත් ජනරජ පෙරමුණ
ஐக்கிய குடியரசு முன்னணி
United Republic Front

# හදමු

එක්සත් ජනරජ පෙරමුණ

## රටට ඔබින දිශානතිය



එක්සත් ජනරජ පෙරමුණ
ஐக்கிய குடியரசு முன்னணி
United Republic Front

ස්ථාවර
ප්‍රජාතන්ත්‍රවාදී
ජනරජයක්

# හදමු

සමෘද්ධිමත්
ධනෝපායන
රාජ්‍යයක්

ජනගරුත්වය
සුරකින
සාධාරණ
සමාජයක්

දියුණු
සංස්කෘතික
පුරවැසියෙක්

ඉන්න
හිතෙන
රටක්...

# හදමු

## රටට ඔබින දිශානතිය

---


**ප්‍රකාශනය**

එක්සත් ජනරජ පෙරමුණ
නො. 4/120,
තලකොටුව උද්‍යානය පාර,
නාරාහේන්පිට,
කොළඹ

දුරකථන: 011 2 514 543
ඊ මේල්: urfsl.info@gmail.com
වෙබ්: www.urf.lk

# පෙළගැස්ම

පූර්විකාව ........ 8 - 9

**වටිනාකම්** ........ **10**

අවංකබව ........ 11
විවෘතබව ........ 12
ප්‍රායෝගිකත්වය ........ 13
සහකම්පනය ........ 14
කුසලතාවාදය ........ 16

**ප්‍රතිපත්ති** ........ **18**

ආර්ථික සමෘද්ධිය ........ 19
තිරසර සංවර්ධනය ........ 25
ස්ථාවර ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යය ........ 26
සමාජ සාධාරණත්වය ........ 28
සමමිතුරු විදේශ ප්‍රතිපත්තිය ........ 30

ඇරයුම ........ 31

# සමාරම්භක ප්‍රතිපත්ති ප්‍රකාශය

අද වර්ෂ 2023 මැයි මස 22 වැනි දිනයි. ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයෙන් සම්පූර්ණයෙන් මිදී, නිදහස් ජනරජයක් බවට පත්වුයේ මින් අඩ සියවසකට වසරකට පෙර, අද වැනි ජනරජ දිනයකයි. මෙවන් ජනරජ දිනයක, එක්සත් ජනරජ පෙරමුණ දොරට වඩින්නේ අපේ මවුබිම ජනරජයක් වී අඩසිය වසකට පසුවත් නොලැබූ පරිපූර්ණ නිදහස එයට ළඟා කරදීමටයි. ශ්‍රී ලංකා ජනරජය තුළ සැබෑ ජනතා නියෝජිතයන් ගෙන් සැදුම් ලත්, ජනතා අභිලාෂයන් මුදුන්පත් කරන, ජනතාවගේ, ජන රජයක් පිහිටුවීමටයි.

## අපට නැති නිදහස

එදා අප නිදහස් වූයේ අධිරාජ්‍යයකිනි. එදා එසේ නිදහස් වූ අප රටේ ආර්ථික නිදහස අදූරදර්ශී, නාස්තිකාර, දූෂිත ක්‍රියාමාර්ග නිසා නැතිවී, අප ලොවට ණය වී ඇත. රට තුළ නීතිය අවභාවිත වීම නිසා ප්‍රජාතාන්ත්‍රික නිදහස අවුල්වී ඇත. පාලකයන් මුග්ධ ලෙසත්, වංචනික ලෙසත් ලොව අන් රටවල් සමඟ ගනුදෙනු කිරීම නිසා අපේ රට ජාත්‍යන්තර වශයෙන් අගෞරවයට පත්ව ඇත. නොදියුණු, අවිද්‍යාත්මක මතවාද වල ජනතාව වෙලී සිටීම නිසා නවීන ලෝකයත් සමඟ ඉදිරියට යාමට බාධා මතු වී ඇත. සමානාත්මතාව මත, ජනවර්ග හා ආගම් අතර ඒකාග්‍රතාවක් ඇති නොවූ නිසා අපට එක් දැයක් ලෙස එක්ව නැගී සිටීමේ හැකියාව අහිමි වී ඇත.

අප රට ඇතැම් සමාජ ආර්ථික දර්ශක වලින් දියුණුවක් ලබා තිබුණත්, දසතින් ඇසෙන්නේ පවතින සමස්ත දුර්දාන්ත, අවිචාර සහගත, අනුකම්පා විරහිත, අසාධාරණ පාලන රටාව නිමා කිරීම උදෙසා නැගෙන ජන හඬයි. ඒ, අද රට වැටී ඇති අභාග්‍යසම්පන්න තත්ත්වය තවදුරටත් ඉවසීමට අපේ රටවැසියන් සූදානම් නැති බැවිනි. එසේ නමුත් විවේචනය කිරීමෙන් ඔබ්බට ගොස් පවතින පාලන ක්‍රමය වෙනස් කිරීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග කවරේදැයි පැවසීමට තරම් දැක්මක්, දැනුමක්, විචාර බුද්ධියක් හෝ අත්දැකීමක් ඇති නව නායකත්වයක් අප රට තුළ කැපී පෙනෙන ලෙස මතුවී නැත. එසේම, එවැනි විභවයක් ඇති ඉදිරිගාමී නායකයන්ට ඒ සඳහා අවස්ථාවක් ද ලැබී නොමැත.

අද අප රටට අවශ්‍යව ඇත්තේ සාමූහික ප්‍රයත්නයකින් රට ගොඩගෙන, ගොඩනගන, අවංක, දක්ෂ, දැක්මක් ඇති, නායකයන් පිරිසකි. රට ගොඩනැගිය හැකි ප්‍රායෝගික වැඩපිළිවෙළකි. පාලන ක්‍රම වෙනසකි. අද දොරට වඩින එක්සත් ජනරජ පෙරමුණේ අපි එවන් වැඩපිළිවෙළක් මත පදනම්ව, අපේ රට ගොඩ ගෙන, ගොඩ නගා, රටට ආර්ථික නිදහසත්, රාජ්‍ය තාන්ත්‍රික නිදහසත්, අවිද්‍යාවෙන් නිදහසත්, පරිපූර්ණ ප්‍රජාතාන්ත්‍රික නිදහසත්, ජාතික සමගියත්, ඒකාග්‍රතාවත්, සමානාත්මතාවත් ලබා දීමට සපථ කර සිටිමු.

## පංචවිධ වටිනාකම් හා පංචවිධ ප්‍රතිපත්ති

අප විශ්වාස කරන්නේ අප මවුබිම ගොඩ නැගීමට, එහි පුරවැසියන් හා පාලකයන් මූලික වටිනාකම් පහක් හා ප්‍රතිපත්ති පහක් මත පිහිටා කටයුතු කළ යුතු බවයි.

එනම්, අවංකබව, විවෘතබව, ප්‍රායෝගිකත්වය, සහකම්පනය සහ කුසලතාවාදය යන වටිනාකම් සහ ආර්ථික සමෘද්ධිය, තිරසර සංවර්ධනය, ස්ථාවර ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යය, සමාජ සාධාරණත්වය, සමමිතුරු විදේශ ප්‍රතිපත්තිය යන ප්‍රතිපත්තීන්ය.

# වටිනාකම්

අවංකබව | විවෘතබව | ප්‍රායෝගිකත්වය
සහකම්පනය | කුසලතාවාදය

1

වටිනාකම්

# අවංකබව

**අවංකකම සමාජය විසින් අගය කළ යුතු සාරධර්මයක් බවට පත් නොකොට මෙරටින් වංචාව හා දුෂණය තුරන් කළ නොහැකිය. අවංක සමාජයක් තැනීමට නම් අවංක බවෙහි අගය කුඩා කල සිට සියලු දෙනාගේ සිත්සතන්හි පැලපදියම් කළ යුතුය. අවංකභාවය මෙරට දේශපාලන සදාචාරයේ මූලිකාංගයක් ලෙස ඔසවා තැබිය යුතුය.**

අප රට අද වැටී සිටින ආර්ථික අර්බුදය එසේ සිදුවන්නේ යැයි මෙයට බොහෝ කලකට පෙර පුරෝකථනය කොට රටටත්, රට පාලනය කළ නායකයන්ටත් අනතුරු හැඟවූයේ අප පක්ෂයේ නායකත්වය විසිනි. එසේ කළේ, මුදල් වංචා කිරීමේ ඒකායන අරමුණ ඇතිව, කිසිදු ආයෝජන විශ්ලේෂණයක් නොකොට, වැඩි පොලියට, රටට කිසිදු ප්‍රතිලාභයක් නොලැබෙන ව්‍යාපෘති සඳහා වංචනික පාලකයන් විදේශීය ණය මුදල් ගෙන ඇස්බැන්දුම් ව්‍යාපෘති සිදු කරන බව පෙනුණු විටය. මෙවන් දේ සඳහා පාලකයන් මුදල් ණයට ගෙන ඉන් විශාල පංගුවක් කොමිස් මුදල් ලෙස තම මඩි තරකර ගත්ත ද, අවසාන වශයෙන් රට බංකොළොත් වී දුක් විඳීමට සිදුවූයේ අපේ රටේ ජනතාවටයි. ණය ගෙවීමට සිදුවූයේ ද මේ කිසිවක් නොදැන සිටි රට වැසියන්ටයි.

මේ තත්ත්වයට ඇති විසඳුම් වන්නේ සොරුන්ට දඬුවම් කිරීම සහ සොරකම් කළ ධනය සොයා ඒවා නැවත අප රටට ගෙන ඒම වැනි සරල ක්‍රියාමාර්ග යැයි, පැසුණු දැනුමක් හා තැන්පත් බවක් නැති ඇතැම් නායකයෝ පවසති. සොරුන්ට දඬුවම් කිරීමත් සොරකම් කළ ධනය සොයා ගැනීමත් වැදගත් නමුත්, එය කළ පමණින්ම දුෂණය රටින් තුරන් වී වංචනික නායකයන්, නිලධාරීන් හා ජාවාරම්කරුවන් අවංක වන්නේ යැයි අපි විශ්වාස නොකරමු. කළ යුත්තේ අප රටේ ඉහළ සිට පහළට වෙලා ඇති අල්ලස, දුෂණය, නාස්තිය හා වංචාව නැති කිරීමට අවශ්‍ය නීති හා ක්‍රමවේද සම්පාදනය කිරීමයි. ඒ නීති හා ක්‍රමවේද අකුරටම ක්‍රියාත්මක කිරීමයි. මෙය සාක්ෂාත් කර ගැනීමට දැනට පවතින නීති වලට වඩා දැඩි නීති හඳුන්වාදිය යුතු බව අපේ අදහසයි. අප මේ ප්‍රකාශනයේ විවිධ තැන්වල සඳහන් කර ඇති ක්‍රමවේද තුළින් සියලු රාජ්‍ය කටයුතු සනීතික ලෙසත්, පාරදෘශ්‍ය ලෙසත්, වගකීමකින් හා වගවීමකින් යුතුව සිදුකළහොත් අද අප මුහුණපා ඇති ව්‍යසනය වැන්නක් ඉදිරියේදී අප රටට අත් නොවනු ඇත.

මේ ක්‍රියාමාර්ග මගින් අවංකභාවය ක්‍රියාත්මක වන රටක් ඇතිකරන අතරතුර, දුෂණවළ නියුතු වුවන්ට එරෙහිව නීතිය කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කොට දැඩි දඬුවම් පැමිණවීමත්, ඔවුන් සොරකම් කළ ධනය සොයාගෙන ඒ වත්කම් රටට පවරා ගැනීමටත් අපි පියවර ගන්නෙමු.

# 2 වටිනාකම් විවෘතබව

**විවෘත ආණ්ඩු ප්‍රවර්ධනය අප පිළිගන්නා ප්‍රධාන ආණ්ඩුකරණ මූලධර්මයකි. දේශපාලඥයන්ගේ පමණක් නොව රාජ්‍ය නිලධාරීන්, ධනවතුන් හා අන් සියලු දෙනාගේ දේපොළ, වත්කම් හා වියදම් පාරදෘශ්‍ය කිරීමේ ක්‍රමවේද ඇති නොකොට මෙරටින් දූෂණය තුරන්කළ නොහැකි බව අපගේ වැටහීමය.**

මේ සඳහා සියලු බැංකු කටයුතු, මූල්‍ය ගනුදෙනු, නිශ්චල හා චංචල දේපොළ හිමිකම්, පුද්ගල බදු ගෙවීම්, රාජ්‍ය බදු අය කිරීම් ඒකාග්‍ර කොට එක් “ඩිජිටල් වේදිකාවකට” ගෙන එන්නෙමු. මෙ මගින් දූෂණයට වැට බැදෙනු ඇත. එසේ ම දූෂණ විරෝධී නීති ශක්තිමත් කිරීම, ඒ පිළිබඳ විමර්ශන කටයුතු කෙරෙන ආයතන වල විශේෂඥභාවය හා කාර්යක්ෂමතාව ඉහළ නැංවීම ද, කරන්නෙමු.

රාජ්‍යයේ සිදුවන වැදගත් මූල්‍ය කටයුතු පිළිබඳව ජනතාවට තොරතුරු දැනගැනීමට ඇති අයිතිය අපි බලවත් කරමු. තම රටේ ධනය කෙසේ එක් කෙරෙන්නේද යන්නත්, එය කෙසේ වියදම් කෙරෙන්නේද යන්නත් දැනගැනීමේ අයිතිය රාජ්‍යයට බදු ගෙවන ජනතාව සතු ප්‍රධානම අයිතියක් බවට පත්කිරීමට අවශ්‍ය නීති රීති ගෙන එන්නෙමු.

රජය විසින් කරනු ලබන මිලදී ගැනීම් හා විකිණීම් සියල්ල ජාලගත කොට විවෘතව, විශේෂඥ මතවලට අනුකූලව සිදුකිරීම ද අනිවාර්ය කරන්නෙමු .මෙය එක් රැයකින් කළ නොහැකි වුවත්, එසේ කිරීමේදී අතළොස්සක් වන දූෂිත රාජ්‍ය නිලධාරීන් සිදු කරන බාධාවන්ට මුහුණ දීමට සිදු වුවත්, දැඩි අධිෂ්ඨානයකින් යුතුව මෙය කිරීමට අපි බැඳී සිටිමු.

මහජන ජීවිතයට තදින් බලපාන ආර්ථික, මූල්‍ය, සංවර්ධන හා පරිපාලන ක්‍රියාකාරකම් නියාමනය කරන ආයතන දේශපාලන හස්තයෙන් මුදා වෘත්තීය මට්ටමේ ආයතන බවට පත්කිරීම රටක සංවර්ධනයේ මූලික අංගයකි. අප රට තුළ මහ බැංකුවේ පටන් විවිධ ක්ෂේත්‍ර වල කටයුතු නියාමනය කරන ආයතන සිය ගණනක් ඇත. අපි මේ සියලු ආයතන හඳුනාගෙන, ඒවා සෘජු දේශපාලන බලපෑම් වලින් තොර කිරීමට අවශ්‍ය නීති සම්පාදනය කොට, ඒවා ඒ ඒ ක්ෂේත්‍රයට අදාළ විෂය ප්‍රවීණයන්ගෙන් සමන්විත ආයතන බවට පත් කරන්නෙමු. ඒවාට පත්වීම් සිදු කිරීම, කටයුතු අධීක්ෂණය, තනතුරු වලින් ඉවත්කිරීම වැනි බලතල විෂය භාර ඇමතිවරුන්ගේ සෘජු බලපෑමෙන් ඉවත් කිරීමට අපි කටයුතු කරන්නෙමු.

3

වටිනාකම්

# ප්‍රායෝගිකත්වය

**ප්‍රවතින සියලු දේශපාලන මතවාදවල අප රටට, අප රටේ ඉදිරි ගමනට, ඉවහල් වන අංග මෙන් ම, නොගැළපෙන අංග ද ඇති බව අපි දනිමු. යම් ප්‍රශ්නයක් විසඳීමේදී වඩා වැදගත් වන්නේ එම ප්‍රශ්නය හා බැඳුණු කරුණු විද්‍යානුකූල ලෙස විමසා තේරුම් ගැනීමත්, එවන් ප්‍රශ්න හමුවේ අප රටේ සහ ලොව අන් රටවල පිළිපැද සාර්ථක වූ හෝ අසාර්ථක වූ උපායමාර්ග මොනවාදැයි විමසීමත් ය. එසේ විමසා බලා අප රටට කෙටිකාලීනව හා දිගුකාලීනව ගැළපෙන සුදුසුම ක්‍රියාමාර්ගය අනුගමනය කිරීමයි. ලෝකයේ දියුණු සමාජ ප්‍රජාතන්ත්‍රවාදී රටවල් ද අනුගමනය කරන්නේ එවැනි පිළිවෙතකි.**

එවැන්නකදී මේ එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් අප විසින් ගනු ලබන ක්‍රියා මාර්ගය, කුමන දේශපාලන මතවාදයට අනුගතවන්නේ ද යන්නත්, එය සාර්ථකව ක්‍රියාත්මක වුයේ පෙරදිග රටකද, අපරදිග රටක ද, ධනවාදී රටකද, සමාජවාදී රටක ද යන්නත්, එය විසඳීමට උපදෙස් හා ආධාර ලබාගත යුත්තේ කවුරුන්ගෙන් ද යන්නත්, නොවැදගත් වේ. අප වඩා වැදගත් කොට සලකන්නේ ඕනෑම ප්‍රශ්නයක් විසඳන විට රටේ ප්‍රගමනයට ඉවහල් වන වඩාත් ම ප්‍රායෝගික ක්‍රියාමාර්ගය කුමක්දැයි විමසා බලා එය කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීමයි.

රටක ආර්ථික, සමාජීක, සදාචාරාත්මක දියුණුව සහ සුඛිත මුදිත ජීවන තත්ත්වය එහි වැසියන්ගේ ක්‍රියාවන්හි ඵලදායිභාවය මත රඳා පවතී. නිසි ඵලදායීතාව මත ගොඩනැගෙන සංවර්ධනය යථාර්ථයක් බවට පත් වන්නේ රටක ජනතාව සහ එහි පාලකයන් ප්‍රායෝගිකත්වය මත පදනම් වූ වැඩපිළිවෙළක් නිසි ලෙස ක්‍රියාවේ යෙදවුවෙහාත් පමණි. අප මවුබිම තුළ ඉතිහාසයේ කිසි කලකත් ක්‍රියාත්මක නොවුනේ මෙම ඵලදායි ප්‍රායෝගික වාදයයි.

ගුණාත්මක වශයෙන් ඉහළ තිරසර සංවර්ධනයක් සඳහා රටක් මෙහෙයවිය හැක්කේ විද්‍යාත්මක ලෙස හේතූන් මත පදනම් වූ සිද්ධාන්ත නිසි ලෙස ක්‍රියාවේ යෙදවීමෙන් පමණි. ආර්ථික අගාධයක වැටී ඇති අප දැන් සිංගප්පූරුව, දකුණු කොරියාව, වියට්නාමය, චීනය, සහ ජපානය වැනි රටවල් සිහියට නඟන්නේ එම රටවල් විද්‍යාත්මක ලෙස ප්‍රායෝගික වැඩපිළිවෙළ නිසි ලෙස ක්‍රියාවේ යෙදවීමෙන් ලබාගත් ප්‍රතිඵල ඇස් පනාපිට පෙනෙන බැවිනි.

මතවාදයන්හි නො ඇලුණු නායකයන් තම දේශයන් ගොඩනැගීමට, එම රටවල සුවිශේෂී අනන්‍යතාවන් සැලකිල්ලට ගෙන, නුවණ හා හැකියාව මෙහෙයවා සිදුකළ ක්‍රියාමාර්ග තුළින් ගොඩ ආ රටවල් බොහොමයකි. අප, අපේ රට හා අප රටේ ජනතාව අද වැටී ඇති අගාධයෙන් ගොඩ ගන්නේ ඒ අයුරින් ම පොතේගුරුවාදවල නොඇලී, නොසැලීය.

# 4 වටිනාකම්

# සහකම්පනය

**සහකම්පනය යනු අනෙකෙකුගේ දුක දුටු විට කම්පාවට පත්වී උදවු කිරීමට කැපවීමයි. රටක පාලන තන්ත්‍රය විශේෂයෙන් ම සමාජීක සහකම්පන ගුණාංග පෙරදැරිකරගත් නායකයන්ගෙන් සහ ප්‍රතිපත්ති වලින් සමන්විත විය යුතු බව අපි විශ්වාස කරමු. ආණ්ඩුකරණයේ දී හා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ දී සමාජයේ පීඩාවට පත්වන්නන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු විය යුතුය. මේ සංකල්ප සිතෙහි දරා රටක පාලනය සිදු කරන රජයක් තම පුරවැසියන්ට අත්‍යවශ්‍ය සමාජ ආරක්ෂණ කටයුතු සලසනු ඇත. අපගේ සමාජ ආරක්ෂණ වැඩ පිළිවෙළේ මූලික අංග වනුයේ සමාජ සුභසාධනය හා නිදහස් සෞඛ්‍යයයි.**

## සමාජ සුභ සාධනය

පුද්ගල සුභසාධනය යනු ධනවතුන්ගෙන් හෝ විදේශ රටවලින් හෝ විවිධ සංවිධානවලින් හෝ මුදල් හා ද්‍රව්‍ය සම්මාදම් කොට බෙදාදීම යැයි ඇතැම් නොමේරූ දේශපාලඥයෝ විශ්වාස කරති. මෙවන් ක්‍රියා මගින් මේ දේවල් ලබන්නෝ කිසි දිනක දෙපයින් නැගිට තමන්ට අවශ්‍ය දේ උපයා ගත නොහැකිව, දිගින් දිගටම රජයෙන් හා දේශපාලඥයන්ගෙන් යැපෙන යාචකයන් බවට පත් වෙති. අප සුභසාධන කටයුතු වල නිරත වනු ඇත්තේ මේ දීමනා ලබන්නන් අනාගතයේදී ඒවා අනවශ්‍ය වන, තමන්ගේ ආදායම තමන්ම සරිකර ගන්නා ආර්ථික වශයෙන් ඵලදායී අය බවට ඉක්මනින් පත් කිරීමේ අරමුණිනි.

සුභ සාධනයට යෙදවෙන්නේ මහජන බදු මුදල් බව හොඳින් දන්නා අපි එම මුදල් අපතේ නොයැවීමටත්, අත්‍යවශ්‍ය අංශ වලට පමණක් යෙදවීමටත් පියවර ගන්නෙමු. එසේම දැනට සමෘද්ධි වැනි දීමනා ලබන්නන් පිළිබඳව යථාවාදී සමීක්ෂණයක් කොට,දේශපාලන බලපෑමකින් හෝ පුද්ගල දැන හැඳුනුම්කම් වලින් බැහැරව ලැබිය යුත්තන්ට පමණක් ඒවා ලබාදීමට අපි කටයුතු කරමු.

අද වනවිට අඩු අවධානයකට ලක්ව තිබෙන වැඩිහිටියන් ආරක්ෂණයට ජාතික වැඩ පිළිවෙළක් අපි සකස් කරන්නෙමු. රටට තම ශ්‍රමයෙන් දායකත්වය දුන් වැඩිහිටියන්ට තම පවුල් සමග ම සිටියදී හෝ තනිව සිටියදී හෝ වැඩිහිටි නිවාස තුළ සිටියදී හෝ රජයේ උපකාර හා අධීක්ෂණය ලබාදීමත්, ඔවුන්ට සුවිශේෂී වූ වෛද්‍ය පහසුකම් ලබාදීමටත් අපි කටයුතු කරමු.

දරුවන් රැකබලාගැනීම ප්‍රමිතියකින් යුතුව, පහසු මිලට කෙරෙන ළමා සුරැකුම් මධ්‍යස්ථාන අප රට තුළ නොමැත. එනිසා මවුවරුන්ට තම පූර්ණ ශක්‍යතාවකින් පිරිමින් හා උරෙනුර ගැටී රැකියා කිරීමට නොහැකි බවත්, මෙය රැකියා ස්ථාන තුළ අසමාන අවස්ථා උදාකර දෙන බවත් අපි වටහා ගෙන සිටිමු. අපි, රජයේ අධීක්ෂණය යටතේ, රජය විසින්ද, රැකියා ස්ථාන

විසින්ද, පෞද්ගලික ආයතන විසින් ද, වෙනත් සමාජ සංවිධාන විසින් ද පවත්වාගෙන යනු ලබන විශිෂ්ට මට්ටමේ දීප ව්‍යාප්ත දරු සුරැකුම් මධ්‍යස්ථාන ජාලයක් ඇති කරන්නෙමු.

ආබාධිත පුරවැසියන් ඔවුන්ගේ හැකියාවන්ගේ ප්‍රමාණයට සමාජයට අන්තර්ග්‍රහණය කොට ඵලදායි පුරවැසියන් බවට පත් කිරීමටත්, ඔවුන්ගේ අවශ්‍යතාවන්ට සරිලන භෞතික වෙනස්කම් හැකි සෑම ප්‍රසිද්ධ ස්ථානයක ම සිදුකිරීමටත් අපි කටයුතු කරමු. සමාජයේ උදව් අවැසි අයට ඔවුන් ජීවත්වන පරිසරය තුළ ම අවශ්‍ය රැකවරණ ලැබෙන ප්‍රජා මූල සංරක්ෂණ ක්‍රමයන් ඇති කරන්නෙමු.

## සෞඛ්‍යය

රටේ සෑම පුරවැසියෙකුට ම මුදල් නොගෙවා සෞඛ්‍ය පහසුකම් ලබා ගැනීමට ඇති අයිතිය අපි සුරකිමු. අපේ රට ලොවෙහි ඉතා අඩු ඒක පුද්ගල සෞඛ්‍ය වියදමකින් යහපත් සෞඛ්‍ය සේවයක් ලබාදෙන රටක් ලෙස ජාත්‍යන්තර සංවිධානවලින් පැසසුම් ලබන බව අපි දනිමු. අප රටේ නිදහස් සෞඛ්‍ය සේවයක් පවතින බව පැවසුවත්, මුළු දළ ජාතික සෞඛ්‍ය වියදමින් අඩක් පමණ අපේ පුරවැසියන් තම පෞද්ගලික වියදමින් දරන බවද, රෝහල් වල තදබදය, ඖෂධ හිඟකම, පෞද්ගලික සෞඛ්‍ය සේවාවන්හි මිල අධික කම නිසා ජනතාව පීඩා විඳින බවද අපි දනිමු. අද පවතින නිදහස් සෞඛ්‍ය සේවාවන් 5S, කායිසන් වැනි නවීන ක්‍රමවේද තුළින් වඩා කාර්යක්ෂම කරන අතරතුර, දැනට මුදල් ගෙවා ලබාගන්නා සේවාවන් සඳහා ජාතික සෞඛ්‍ය රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දීමට කටයුතු කරමු. රෝග වැළැක්වීමේ ක්‍රියාවලියට මුල්තැන දීමට පියවර ගනිමු. මෙරට නිපදවීමට ඵලදායිතාව ඇති සියලු ඖෂධ රජයෙන් හෝ පෞද්ගලික ආයතන තුළින් නිපදවීමට අපි පියවර ගන්නෙමු.

ශ්‍රී ලංකාව තුළ චිරාත් කාලයක් තිස්සේ පැවැති පෙරදිග පාරම්පරික වෛද්‍ය ක්‍රම වැඩි දියුණු කිරීමට ද, සංරක්ෂණය කිරීමට ද අපි කටයුතු කරන්නෙමු. එසේම වර්තමානයේ ලොව පුරා ව්‍යාප්ත වෙමින් පවතින පෙරදිග හා පාරම්පරික වෛද්‍ය ක්‍රම හා ඖෂධ නිෂ්පාදනය ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව අප රට තුළ වැඩිදියුණු කිරීම තුළින් එය විදේශ විනිමය උත්පාදන උල්පතක් බවට පත් කරන්නෙමු.

# 5 වටිනාකම්

# කුසලතාවාදය

**රටක් ගොඩනැගිය හැක්කේ එය කළ හැකි දැනුමක් ඇති, දැක්මක් ඇති, ජනතාවට මග පෙන්විය හැකි පිරිසකට පමණි. පාරම්පරික උරුමය නිසා හෝ ධන බලය නිසා හෝ මැර බලය නිසා හෝ හිස් බස් උස් හඬින් පැවසීමේ හැකියාව නිසා හෝ නායකයන් තෝරා ගැනීමේ අවාසනාවන්ත ඉරණම අද අපේ මවුබිම අත් විඳිමින් සිටී.**

රටට, ජනතාවට, සහ ලොවට වැඩදායක අන්දමින් සේවය කිරීමට කුසලතාව ඇති පිරිසක් වෙත, රාජ්‍යය හා එහි ආයතනයන්හි පාලනය භාර නොදී, තැනිය හැකි රටක් නැත. එක්සත් ජනරජ පෙරමුණේ අපි එවන් දක්ෂයන්ට නිසි තැන දී, අද රට වැටී ඇති අගාධයෙන් ගොඩගෙන එය සෞභාග්‍යවත් රටක් බවට පත් කිරීමට කැප වන්නෙමු. මෙවන් දක්ෂයන් තෝරා ගැනීමේදී ඔවුන් තුළ ඇති දැනුම, පළපුරුද්ද, කාර්යක්ෂම බව, දක්ෂතාව, අවංකකම, කැපවීම වැනි කුසලතාවන් විනා පවුල් බලය, මිතුරු බලය, ධන බලය, මැර බලය වැනි කිසිවක් අපි නොසළකමු.

## ඉගෙනුම

ඉගෙනුම සිදුවිය යුත්තේ රටේ දරුවන්ගේත්, පුරවැසියන්ගේත් දැනුම, ආකල්ප හා කුසලතාවන් ඔප් නැංවීමටයි. අධ්‍යාපනය ලැබීම උසස් පුරවැසි අයිතියක් ලෙස සළකමින්, සෑම දරුවෙකුට ම ඉගැනුමට සම අවස්ථාවක් ලැබීමට නම් ළදරු වියේ සිට විශ්ව විද්‍යාලය අවසන්වන තුරු මුදල් නොගෙවන අධ්‍යාපන ක්‍රමයක් පැවතිය යුතු බව අපි විශ්වාස කරමු. ළදරු වියේ සිට ම අවංකබව, විවෘතබව, ප්‍රායෝගිකත්වය, සහකම්පනය දරුවන්ගේ සිත් තුළ තහවුරු කිරීම සඳහා පාසල කටයුතු කළ යුතුය. පාසලින් නික්ම යන දරුවා නවීන දැනුමෙන් සන්නද්ධ, රට තැනීමට නායකත්වය ගත හැකි, සමාජ අත්දැකීමෙන් හෙබි අංග සම්පූර්ණ පුරවැසියෙකු විය යුතුය.


1943 දී නිදහස් අධ්‍යාපනය අප රට තුළ තහවුරු වීමෙන් පසු අප රටේ ජනතාවගේ සාක්ෂරතාව ඉහළ ගොස්, අධ්‍යාපනය ලබා සමාජයේ ඉදිරියට යාමේ අවස්ථාව බොහෝ දෙනාට හිමි විය. එසේ වෙතත් නවීන ලෝකයට සරිලන, තමන්ට, රටට සහ ලොවට වැඩදායි පුරවැසියකු බිහි කිරීමට වත්මන් අධ්‍යාපන ක්‍රමය අසමත්ව ඇති බව නොරහසකි. පවතින අධ්‍යාපන ක්‍රමවේද වෙනස් නොකළහොත්, දැනට පවතින අයුරින් ම පාසලෙන් නික්ම යන තරුණ තරුණියන්ට නූතන වැඩ ලෝකයට සරිලන පරිදි දැනුම සහ හැකියාව ලබාගැනීමට හා ජාත්‍යන්තරයට මුහුණ දීමට නොහැකි වනු ඇත.

මේ තත්ත්වය වෙනස් කිරීමට ලොව අන් රටවල අධ්‍යාපන ක්‍රමවේද, නිදහස් මනසකින් හදාරා, අපේ රටේ පවත්නා තත්ත්වයන්ට සරිලන නව ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් අපි හඳුන්වා දෙන්නෙමු . මුදල් ගෙවා අධ්‍යාපනය ලබා දෙන පාසල්

හා විශ්ව විද්‍යාලවල ගුණාත්මකභාවය තහවුරු කිරීමට ද, ඒවා ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියට අනුකූලව ක්‍රියාත්මක වන්නේදැයි, නියාමනය කිරීමට ශක්තිමත් යාන්ත්‍රණයක් ඇති කරන්නෙමු.

තාක්ෂණ හා පරිගණක අධ්‍යාපනයට විශේෂ අවධානයක් යොමුකොට නවීන ලෝකයට හා රැකියා වෙළෙඳපොළට ගැළපෙන තරුණ පරපුරක් බිහිකිරීමට අපි පියවර ගනිමු.

අධ්‍යාපනය යනු පාසලෙන් නික්මීමත් සමග අවසන් වන ක්‍රියාවලියක් බවට දැනට ඇති සමාජ මතය වෙනස් කළ යුතුය. ඒ අනුව රටේ පුරවැසියන් සියලු දෙනා සැමවිට, සැමදා නව තාක්ෂණය හා විචාරාත්මක දැනුම ලබාගැනීමට පිපාසයෙන් සිටින පිරිසක් බවට පත්කිරීමට බහුවිධ දැනුවත් කිරීම් හා පුහුණු පාඨමාලා පවත්වමින් මුළු රට ම දැනුම මත පදනම් වූ සමාජයක් බවට පත්කරන්නෙමු.



# ප්‍රතිපත්ති

ආර්ථික සමෘද්ධිය | තිරසර සංවර්ධනය
ස්ථාවර ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යය | සමාජ සාධාරණත්වය
සමමිතුරු විදේශ ප්‍රතිපත්තිය

6

ප්‍රතිපත්ති

# ආර්ථික සමෘද්ධිය

**අප ගොඩනගන්නේ දැනුම මත පදනම්ව, නවෝත්පාදනවලට සිදුකරන, තිරසර සමාජ වෙළෙඳපොළ ආර්ථික ක්‍රමයකි. අප රටේ ආර්ථික සමෘද්ධිය ලොවින් වෙන්වී අත්කර ගත නොහැකි බව අපගේ මතයයි. නව නිපැයුම් තුළින් හා තම රටවලට ගැළපෙන ආර්ථික ක්‍රියාවලි තුළින් ලොවෙහි ආර්ථික වශයෙන් නොදියුණුව පැවති රටවල් දියුණු වෙද්දී, අප ද ලොව සමග අත්වැල් බැඳ ඉදිරියට ගමන් කළ යුතුය. දූෂණය තුරන් කරලීම, රාජ්‍යයේ ස්ථාවර බව, නීතියේ ආධිපත්‍යය සහ සමාජ සාධාරණත්වය ආර්ථික සමෘද්ධියේ මූලික කොන්දේසි වේ. මේ මූලික අංග රටෙහි ස්ථාපිත කර, ස්ව-ශක්තියෙන්, උකටලී නොවී, සුහුරු ලෙස ධනෝත්පාදනය කර තම ජීවිතයත්, රටත් සමෘද්ධිමත් කරන ධනවත් සහ ගුණවත් ජනතාවක් බිහිකිරීම අපේ අරමුණයි.**

## ගාමක බලවේගයටත් කුසලතාව

ආර්ථික සමෘද්ධියේ ගාමක බලවේගය පෞද්ගලික අංශය බව අපි විශ්වාස කරමු. එහෙත් ඒ ගාමක බලවේගයේ පූර්ණ ශක්‍යතාව නෙලා ගැනීමට නම් "කුසලතාවට මුල්තැන" යන සංකල්පය පෞද්ගලික අංශයට ද අදාළ විය යුතුය.

අද අප රටේ පෞද්ගලික අංශය තුළ මුල්තැන ලැබෙන්නේ දේශපාලකයන්, දූෂිත නිලධාරීන් සමග අත්වැල් බැඳගෙන කොමිස් මුදල් බෙදා ගන්නා වූ, රාජ්‍ය දේපොළ සොරකම් කරන්නා වූ, බදු මුදල් පැහැර හරින්නා වූ, බැංකු ණය පැහැර හරින්නා වූ, අසාධාරණ බදු සහන ලබා ගන්නා වූ, දූෂිත මැර දේශපාලනයට උදවු දෙන්නා වූ, ජාවාරම්කරුවන් කොටසකට යි. මොවුන්ට ලැබෙන මේ අසාධාරණ උදවු නිසා තම කුසලතාවෙන්, සාධාරණ වෙළෙඳ උපායයන්ගෙන්, නව නිපැයුම් තුළින්, ආනයන හා අපනයනයෙන් ඉදිරියට ආ හැකි සැබෑ දක්ෂයන්ට ඇති අවස්ථාව ඇහිරී ඇත.

අප රටේ සිටින අති විශාල බහුතරයක් වන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයෝ මේ අසාධාරණ අසමාන තරගය නිසා තම ව්‍යවසායයන් දියුණු කරගැනීමට නොහැකිව ලතැවිල්ලෙන් පසුවෙති. අපි මේ දුර්භාග්‍ය සම්පන්න තත්ත්වය වෙනස් කරන්නෙමු. අපි අපේ රට තුළ කුසලතා පූර්ණ සැමට, සමාන අවස්ථා ඇති පෞද්ගලික අංශයක් බිහි කරමු. කාර්යාල තුළ, බැංකු තුළ, නියාමන ආයතන තුළ, රේගුව තුළ, ආදායම් බදු අංශය තුළ සැමට සමව සලකන ක්‍රමවේදයන් සකස් කරන්නෙමු.

දේශපාලන අනුග්‍රාහකත්වය හා මැර බලය මත ජාවාරම්කාර ව්‍යාපාරිකයන් විසින් ගොඩනගා තිබෙන වෙළෙඳ ඒකාධිකාර නිසා ද අන් අයට ඉදිරියට ඒමේ හැකියාවක් නැත. එසේ ම වෙළෙඳපොළ මිල ගණන් හැසිරවීම තුළින් මේ දූෂිතයෝ

රටේ ජනතාව ද සූරා කති. අසාධාරණ ලෙස කටයුතු කරන වෙළෙඳ ඒකාධිකාර පාලනය කිරීම තුළින් අන් ව්‍යාපාරිකයන්ට සේ ම පාරිභෝගිකයන්ට වාසි සැලසීමට අපි අදහස් කරමු.

## නවෝත්පාදනවලට මුල්තැන

රට තුළ නිපැයුම් වැඩි කිරීමකින් තොරව රටෙහි ආදායම වැඩි නොකළ හැකි බව අපි දනිමු. එසේ කිරීමේදී මූලික නිපැයුම් පමණක් කරන කර්මාන්ත වලින් ඔබ්බට ගොස් නවීන කර්මාන්ත අරඹා, නවීන තාක්ෂණය හා ක්‍රමවේද තුළින් කාර්යක්ෂයමතාව ඉහළ නංවා, ඒක පුද්ගල නිෂ්පාදන පරිමාව වැඩි කිරීම අපගේ මූලික ඉලක්කය වනු ඇත. මෙමගින් හැකි ඉක්මනින් දළ දේශීය නිෂ්පාදිතය වැඩි කරන්නෙමු.

විශේෂයෙන් ම තරුණ නිෂ්පාදකයන්ට හා ව්‍යවසායකයන්ට පරිගණක තාක්ෂණය, නැනෝ තාක්ෂණය, ජීව තාක්ෂණය, කෘත්‍රිම බුද්ධිය, රොබෝ තාක්ෂණය ආශ්‍රිත නවෝත්පාදන වලට යොමු වීම පිණිස අවශ්‍ය අතහිත දීම සිදු කරමු. මෙමගින් හතරවන කාර්මික විප්ලවය රට තුළ ඇති කරන්නෙමු. අප විශ්වාස කරන්නේ අපේ තරුණ ප්‍රජාව තුළ මෙවන් දෑ කළ හැකි විස්මතුන් රැසක් සිටින බවයි.

## ලොව සමග අත්වැල් බැඳ ගැනීම

ජාත්‍යන්තර වෙළෙඳ ජාලයන්ගෙන් බැඳුණු ලොවක් ඇති වර්තමානයේ, අපට අවශ්‍ය වන සියලු දේ අප රට තුළ ම නිපදවිය යුතු යැයි යන අන්තවාදී මතයක එල්බ ගැනීම ප්‍රායෝගික නොවේ. අපි අපේ රටේ සම්පත් වලින් සහ ශ්‍රම බලකායෙන්, වැඩිම ඵලදායිතාවක් හා ආදායමක් ලබාගත හැකි දෑ මෙරටෙහි නිපදවා, ඒවා ලොවට විකුණා ලබන ආදායමින් අපට වාසිදායක නොවන, නිෂ්පාදන පිරිවැය අධික දෑ අන් රට වලින් අඩු මිලකට ලබා ගැනීමට කටයුතු කරමු. අපගේ ජාත්‍යන්තර වෙළෙඳ ප්‍රතිපත්තිය අවශ්‍ය ව්‍යතිරේක සමගින්, තුලනාත්මක හා සාපේක්ෂ වාසි ආර්ථික මූලධර්ම මත උපරිම ප්‍රයෝජන ගැනීමේ උපාය මාර්ගික දැක්මක් ඔස්සේ ගොඩනගමු.

## ගෝලීය වෙළෙඳපොළ ජයගැනීම

ගෝලීය වෙළෙඳපොළ ජයගැනීම සඳහා ජාත්‍යන්තර වශයෙන් පිළිගන්නා සන්නාම බිහි කිරීමත්, ජාත්‍යන්තර නිෂ්පාදන දාමයන්හි පාර්ශවකරුවන් බවට පත්වීමත්, දේශීය සමාගම් බහුජාතික සමාගම් දක්වා වර්ධනය කිරීමත් අපගේ ආර්ථික මූලෝපායන් ලෙස පිළිගතයුතු බව අපගේ අදහසයි.

මේ සඳහා විදේශ ආයෝජකයන් මෙරටට පැමිණීම අත්‍යවශ්‍යය. අද මෙරට ඇත්තේ විදේශ ආයෝජනයන්ට අහිතකර වාතාවරණයකි. විදේශ ආයෝජනයන් රැගෙන එන්නන් මුහුණ දෙන්නේ අද අප රටේ පවතින දූෂිත, අකාර්යක්ෂම දේශපාලන හා පරිපාලනමය යාන්ත්‍රණයටයි. මේ සියල්ලට මුහුණ දී මෙරටෙහි ආයෝජනයක් කළත්, රජය සහ ජාවාරම්කාර දේශීය ධනවතුන් තම බලය පෙන්වා මේ විදේශ ආයෝජන අසාධාරණ ලෙස මංකොල්ල කෑ අවස්ථා එමට ය. අපි මේ තත්ත්වය වෙනස් කොට විදේශ ආයෝජනවලට හිතකර, කාර්යක්ෂම, පාරදෘශ්‍ය, ආරක්ෂාකාරී ක්‍රමවේද රට තුළ ස්ථාපිත කරන්නෙමු.

## සංචාරක ව්‍යාපාරය

අප රටේ වැදගත් ආදායම් මාර්ගයක් වන සංචාරක ව්‍යාපාරය ගුණාත්මක ලෙස ද, ප්‍රමාණාත්මක ලෙස ද අපගේ සමාජ හා සංස්කෘතික වටිනාකම් ආරක්ෂා කර ගනිමින් ලොව අන් රටවල් සමග තරගකාරී ලෙස ප්‍රවර්ධනය කරන්නෙමු. මේ සඳහා අප රට, සංස්කෘතික සංචරණ, කෘෂි සංචරණ, සෞඛ්‍ය සංචරණ, ගවේෂණ සංචරණ, විවේක හා විනෝදාත්මක සංචරණ වැනි බහුවිධ සංචරණයන් සඳහා සංචාරකයන් ඇදෙන කේන්ද්‍රයක් බවට පත් කළ යුතුය.

## කෘෂිකර්මය හා සත්ත්ව පාලනය

දැනට අප රටේ මුළු ශ්‍රම බලකායෙන් 25%ක් කෘෂිකර්මාන්තයේ නියැලුණත් එය රටේ දල ජාතික නිෂ්පාදිතයට එක් කරන්නේ 7% ක් පමණි. මෙයිනුත් වී ගොවිතැනින් එක්වන්නේ 2% කි. "ගොවියා දෙවියා" යැයි කියමින් කපටි නායකයන් නිසරු බස් කිවුවත්, අපේ ගොවියා සදහට ම දුගී බවේ ගිලී සිටී.

ලොවෙහි ජනගහන ඝනත්වය වැඩිම රටක් වන ශ්‍රී ලංකාවේ පවතින කුඩා බිම් ප්‍රමාණයෙන් ලැබෙන භෝග ඵලදාව ලොවෙහි බොහෝ රටවලට වඩා ඉතා අඩු මට්ටමක පවතී. මෙයට හේතු ලෙස අප හඳුනාගෙන ඇත්තේ වැඩි අස්වැන්නක් හා වැඩි ආදායමක් ලබා ගත හැකි ගොවිකම් ක්‍රම හා භෝග වර්ග පරිසරයට අවම හානියක් වන ලෙස වගා කිරීම ගැන අපේ ගොවියන් වෙත ලබා දී ඇති අඩු දැනුමයි. අනෙක් අතින් නවීන ගොවිතැන් ක්‍රමවලට යොමු වීමට අදාළව ඔවුන් මුහුණ පාන මූලධන හිඟකමයි. ඔවුන්ට ඇති ප්‍රාග්ධනයෙහි මඳ කමයි. අතරමැදියන් ගොවියා පෙළන්නේ ගොවියන්ට ඇති ආර්ථික හා විද්‍යාත්මක දැනුම, ප්‍රාග්ධන හා සන්නිවේදන දුර්වලතා නිසා බව හඳුනාගෙන ඒ ප්‍රශ්න විසඳීමට අපි කටයුතු කරමු.

අප අඩු භූමි ප්‍රමාණයකින් වැඩි අස්වැන්නක් ලබාදෙන නවීන "සුහුරු කෘෂිකර්ම" ක්‍රමවේදයන් රට තුළ ප්‍රචලිත කරන්නෙමු. එසේ ම නවීන පර්යේෂණ සිදු කොට අපනයන මට්ටමේ කෘෂි නිපැයුම් නිමි වෙළෙඳ භාණ්ඩ ලෙස, දේශීය හා විදේශීය වෙළෙඳපොළට ඉදිරිපත් කිරීමට අපි පියවර ගන්නෙමු. සත්ත්ව පාලනයේදී ද මෙවන් නවීන දැනුම භාවිතා කිරීමට අප සත්ව පාලන හිමිකරුවන් පොළඹවන්නෙමු. කෘෂිකර්මය නගා සිටුවීම වෙනුවෙන් රටේ දැනට තිබෙන රාජ්‍ය ආයතන ජාලයෙහි දැවැන්ත ප්‍රතිසංවිධානයක් සිදු කරන්නෙමු.

ඒ අතර අපගේ සාම්ප්‍රදායික කෘෂිකාර්මික දැනුම, ශිල්ප ක්‍රම, භෝග වර්ග ආදී නිසිපරිදි සංරක්ෂණය කිරීමට ද පියවර ගනිමු.

## ධීවර කර්මාන්තය සහ සාගර ආර්ථිකය

අපි ජාතික සමුද්‍රීය ප්‍රතිපත්තියක් සහ සාගර ආර්ථික ප්‍රතිපත්තියක් නිර්මාණය කරන්නෙමු. එ මගින් අපට අනන්‍ය වූ සාගර ආර්ථික කලාපය සහ මහාද්වීපික තටාකය තුළ ඇති සාගර සම්පත්වල පල නෙලාගන්නෙමු. සාගරයේ සම්පත් තිරසර ලෙස කළමනාකරණය කොට, මත්ස්‍ය වැනි ජීව සම්පත් නෙලාගැනීම ද, තෙල්, ගෑස්, ඛනිජ වැනි අජීව සම්පත් නෙලාගැනීම ද කාර්යක්ෂමව කරන්නෙමු. ඉහත ජීව සම්පත් නෙලාගැනීමට නම් ධීවරයන්ට නවීන දැනුම හා මෙවලම් ලබාදී, මත්ස්‍ය කර්මාන්තයේ සියලු අංශවලට දී ඩිජිටල් තාක්ෂණය

හඳුන්වාදීම කළ යුතුය. මත්ස්‍ය වගාව රට තුළ ප්‍රචලිත කළ යුතුය. ඒ හැරුණු කොට සමුද්‍රීය වානිජ කටයුතු අප රටට විදේශ විනිමය ලබාදෙන ප්‍රධාන අංශයක් බවට පත් කරන්නෙමු. මේ සියල්ල අප කරන්නේ සමුද්‍රීය පරිසර සංරක්ෂණයෙහි සහ සමුද්‍රීය ආරක්ෂාවේ වැදගත්කම සිතෙහි දරාගෙන ය.

## රාජ්‍ය අංශය

ලංකාවේ රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යාව අප රටේ ආදායමට ඔරොත්තු නොදෙන තරම් වැඩි බව ද, රාජ්‍ය සේවයේ කාර්යක්ෂමතාව අතෘප්තිමත් මට්ටමක පවතින බව ද අපි පිළිගනිමු. රාජ්‍ය අංශ සමන්විත වනුයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු වැනි සෘජු රාජ්‍ය ආයතන හා සංස්ථා, මණ්ඩල හා රජය සතු සමාගම් වැනි වක්‍ර ලෙස පාලනය කරනු ලබන ආයතන වලිනි. අපි රජය සතු ආයතන ගැන පූර්ණ සමීක්ෂණයක් කොට දැනට එකම ආකාරයේ කාර්යයන් කිරීමට ඇති ආයතන ඒකාබද්ධ කිරීමට කටයුතු කරමු. විෂය දැනුම ඇති පරිපාලකයන්ගේ නායකත්වයෙන්, කාර්යක්ෂම ක්‍රමවේද තුළින් රජයේ ආයතන ජනතාවට පහසුවෙන් සේවය ලබාදෙන ආයතන බවට පත් කරන්නෙමු. විශේෂයෙන් ම රටේ ආර්ථික ආරක්ෂක සහ පරිපාලනමය වශයෙන් මර්මස්ථාන බඳු වූ ආයතන ඉහළ විද්වත් වෘත්තිකයන් විසින් මෙහෙයවන ආයතන බවට පත් කරන්නෙමු.

අත්‍යවශ්‍ය සේවාවන් පවත්වා ගෙන යනු ලබන සියලු ම රාජ්‍ය ආයතනයන් හි කටයුතු පරිගණකගත කොට ඒවා එක් පරිගණක ජාලයක් තුළට ගන්නෙමු. දියුණු රටවල දක්නට ඇති මෙවන් ක්‍රමවේද අනුගමනය කිරීම මගින්, ජනතාවට තම එදිනෙදා කටයුතු කරගැනීම පහසුවෙන අතර, අවම සේවක සංඛ්‍යාවකින් මේ ආයතන පවත්වාගෙන යා හැකි වනු ඇත.

රාජ්‍ය ආයතනයන්හි කටයුතු පරිගණක ගතකොට එක් පරිගණක ජාලයක් තුළට ගැනීම තුළින් රාජ්‍ය නිලධාරීන් අතළොස්සක් විසින් කරනු ලබන දූෂණ හා වංචාවන්ට වැට බැඳෙනු ඇත. දැන් රජයේ කාර්යාල වලට ගොස්, කාලය අපතේ හරිමින් සිදුකළ යුතු බොහෝ කාර්යයන්, අන්තර්ජාලය තුළින් නිවසෙහි සිට කරගත හැකි නවීන ක්‍රමවේද ප්‍රවර්ධනය කරමු.

එසේ ම රජය විසින් කරනු ලබන ප්‍රාග්ධන වියදමට සරිලන ආදායමක් රජයට නොලැබෙන, පාඩු ලබන, ප්‍රතිව්‍යුහගත කළ නොහැකි ආයතන, පාරදෘශ්‍ය ප්‍රසම්පාදන ක්‍රමවේද අනුගමනය කොට ඒවා පෞද්ගලීකරණය කිරීමට හෝ රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය යටතට පත් කිරීමට පියවර ගනිමු. නිෂ්පාදන හා වෙළෙඳ කටයුතු පමණක් කරන ආයතන රජය විසින් සෘජුව පාලනය කිරීම අපි නතර කරමු. විශේෂඥ දක්ෂතා, හා නායකත්වය අවශ්‍යව තිබෙන රාජ්‍ය ආයතනවලට රාජ්‍ය පරිපාලන සේවයේ වෘත්තිකයන්ගේ දායකත්වය තිරසාරව ලබාගත හැකිවන පරිදි පරිපාලන සේවය ප්‍රතිසංවිධානයකට ලක් කරමු.

මේ සියලු කටයුතු මෙහෙයවන රාජ්‍ය සේවකයා මනා පුහුණුවකින් දැනුමකින් හා ඉදිරිගාමී ආකල්පවලින් යුතු තම කටයුතු කරගෙන යාමට අවශ්‍ය ස්වාධීනතාව හා නිදහස හිමි මහජන සේවයට කැපවුණු තෘප්තිමත් හා අභිමානවත් පුද්ගලයෙකු බවට පත් කරන්නෙමු.

## බදු මුදල්

රජයට ආදායම් ලැබෙන්නේ මහ ජනතාව විසින් තමන් මිලදී ගන්නා භාණ්ඩ හා සේවා සඳහා ඔවුන් වක්‍රව හෝ සෘජුව හෝ ගෙවන බදු මුදල් වලින් බව අපි මැනවින් දනිමු . ජනතාව මිලදී ගන්නා භාණ්ඩ හා සේවාවන් වලින් අය කරන වක්‍ර බදු නිසා ජීවන වියදම වැඩිවෙන බැවින් මෙවන් වක්‍ර බදු අඩු කිරීමට අපි කටයුතු කරමු. එසේම එක් එක් පුද්ගලයන්ගේ හා ආයතන වල ආදායම් මට්ටම අනුව අයකර ගනු ලබන සෘජු බදු දැනට වඩා සාධාරණ ලෙසත්, කාර්යක්ෂම ලෙසත් අයකර ගැනීමට අපි කටයුතු කරන්නෙමු.

එසේ ම රේගු බදු, සුරාබදු, රථවාහන බදු, ඉඩම් බදු වැනි රජයේ බදු අයකෙරෙන ආයතන පරිගණක ගත කොට ඒවා එක් ජාලයක් තුළට ගැනීම මගින් ජනතාවට කාර්යක්ෂම, අදූෂිත, පාරදෘශ්‍ය සේවයක් ලබා දීමටත් රාජ්‍ය ආදායම වැඩිකර ගැනීමටත් කටයුතු කරන්නෙමු.

ජනතාව විසින් රජයට ගෙවනු ලබන බදු මුදල් මහජන සේවයෙහි උපරිම ලෙස හා පාරදෘශ්‍ය ලෙස යෙදවෙන බව සහතික කරන්නෙමු. මේ බදු මුදල් තම පෞද්ගලික සුඛ විහරණය සඳහා පාවිච්චි කිරීම, තමන්ගේ පෞද්ගලික ධනයක් සේ සලකා තමන්ගේ ප්‍රතිරූපය ගොඩ නගා ගැනීමේ අරමුණින් අවභාවිත කිරීම, නිසි අධ්‍යයනයකින් තොරව ආයෝජනය කර විනාශ කිරීම වැනි සියලු ක්‍රියා ජාතික අපරාධ ගණයෙහිලා සළකන්නෙමු. බදු පැහැර හැරීම සේ ම, බදු මුදල් අපහරණය කිරීම ද දඬුවම් ලැබිය හැකි වැරදි බවට පත් කරන්නෙමු. බදු මුදල් සාධාරණ ලෙස අය කරගන්නේ ද යන්නත්, එසේ අය කර ගනු ලබන බදු මුදල් නිසි ලෙස වියදම් කරනු ලබන්නේ ද යන්නත්, සොයා බැලීමට ස්වාධීන බදු කොමිසමක් ඇති කරන්නෙමු.

## රාජ්‍ය ආයෝජන

රජය විසින් කරනු ලබන යටිතල පහසුකම් වැනි ආයෝජන හා ව්‍යාපෘති ගැනත්, ඒවාට ආයෝජනය වන මුදල් ප්‍රමාණය, මුදල් ලැබෙන මූලාශ්‍ර හා ඒ ආයෝජනවලින් මානුෂික හෝ මූල්‍යමය ප්‍රතිලාභ ලැබෙන අයුරු සහ අහිතකර පාරිසරික බලපෑම් වැළැක්වීමේ පියවර සඳහන් වන ශක්‍යතා වාර්තා සැකසීම අනිවාර්ය කරමු. එසේ ම, එවන් වාර්තා ආයෝජනයට ප්‍රථම සකස්කොට, ඒ සඳහා නිසි අනුමැතිය ලබාගැනීම ද නීතියෙන් අනිවාර්ය කරන්නෙමු. මෙ මගින් රටට ඵලදායි නොවන, කොමිස් ලබා ගැනීමේ වංචනික චේතනාවෙන් කරන ඇස්බැන්දුම් ව්‍යාපෘති, අසාධාරණ ණය බරක් ලෙස ජනතාවගේ කරපිට පැටවීම නවතිනු ඇත.

## ප්‍රවාහනය

රටක සංවර්ධනයේ ජීවනාලිය වනුයේ ප්‍රවාහන පද්ධතියයි. බලශක්තිය රැකීම අතින් ද, ඒක පුද්ගල වියදම අතින් ද, පරිසරය රැකීම අතින් ද, ගමන් වේගය අතින් ද පොදු ප්‍රවාහන සේවා දියුණු කිරීම රටකට වාසිදායක වේ. එනිසා අප සියලු ආකාරයේ පොදු ප්‍රවාහන සේවා නවීකරණය කිරීමට අවශ්‍ය ජාතික ප්‍රවාහන ප්‍රතිපත්තියක් හඳුන්වා දෙමු. ඒ ප්‍රතිපත්තියට අනුකූලව පොදු ප්‍රවාහන සේවාවන් දියුණු කිරීමට රාජ්‍ය හෝ පෞද්ගලික හෝ රාජ්‍ය-පෞද්ගලික හවුල් ව්‍යාපාර ක්‍රමවේද හඳුන්වා දෙන්නෙමු. මේ සඳහා දේශීය හෝ විදේශීය ආයෝජන හා ආධාර ලබාගන්නෙමු. විශේෂයෙන් නිෂ්පාදන භාණ්ඩ ප්‍රවාහනයේ දී නාස්තිය අවම කොට, කාර්යක්ෂම ලෙස, අඩු මිලකට ප්‍රවාහන කටයුතු කිරීමේ ක්‍රමවේද හා බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථාන ඇති කරන්නෙමු.

## රාජ්‍ය ණය කළමනාකරණය

රටට ප්‍රයෝජනවත් නොවන ව්‍යාපෘති සඳහා අධික පොලියට ණය ගැනීම නිසාත්, ඒ ණය මුදල් වලින් පාලකයන් අතළොස්සක් තම මඩි තරකර ගනිමින් මුදල් අප රටින් පිටතට ගෙන ගිය නිසාත්, අද අපි රටක් ලෙස ණය උගුලක පැටලී සිටිමු. මේ උගුලින් ගැලවීමට නම් ගෝලීය ආර්ථික ප්‍රවණතාවන් සැලකිල්ලට ගනිමින් ජාත්‍යන්තර මූල්‍ය ආයතන හා ණය හිමි රටවල් සමග යථාවාදී බුද්ධිමත් සංවාදයක නියැලීම අත්‍යවශ්‍යය. අප වැටී ඇති උගුලින් ගැලවීමට නම් මෙම යථාර්ථය මගහැරීම සේ ම එම ආයතන නිර්දේශ කරන යෝජනා එලෙසින් ම පිළිගැනීම ප්‍රයෝගික නොවිය හැකිය. ඒ වෙනුවට අපි ක්‍රියාවට නංවන්නේ අදාළ දත්ත වලින් හා සංකල්ප වලින් සන්නද්ධව, ජාත්‍යන්තරය සමග සුහදව සාකච්ඡා කොට අප රටට සහ අපේ ජනතාවට උපරිම වාසි ගෙනදෙන තත්වයන් මත ඔවුන් සමග එකඟතාව ඇතිකර ගැනීමයි. එසේ ම අපගේ සාර්ව ආර්ථික ඉලක්ක සපුරා ගැනීම සඳහා දේශීය වශයෙන් ගතහැකි විකල්ප ක්‍රියාමාර්ග ද ඒ හා සමාන්තරව ගොඩ නගන්නෙමු.

# 7 ප්‍රතිපත්ති

# තිරසර සංවර්ධනය

**අද අප රට ගොඩනැගීමට ගනු ලබන ක්‍රියාමාර්ග නිසා කිසි විටකත් අපේ අනාගත පරපුර හා පරිසරය අනතුරේ නොවැටිය යුතුය. එවැනි ක්‍රියාමාර්ග තුළ සමාජ සාධාරණත්වය තහවුරු විය යුතුය. පුද්ගල සමෘද්ධිය ද ඇති විය යුතුය. එසේ ම ඒ සංවර්ධන ක්‍රියාමාර්ග අප සමාජය පිළිගන්නා, අප රට තුළ දිගුකාලීනව පැලපදියම් කළ හැකි ඒවා විය යුතුය. රට තුළ දිගු කාලීන ලෙස පවත්වා ගෙනයා නොහැකි, අනාගත පරපුර හා පරිසරය අනතුරේ හෙළන, පුද්ගල සමෘද්ධිය හා සමාජ සාධාරණත්වය අත්කර නොදෙන, සංවර්ධන ප්‍රතිපත්ති අපි ක්‍රියාත්මක නොකරමු.**

පරිසර සංරක්ෂණය සිදුකිරීමේදී අන්තවාදී පරිසර සංරක්ෂණ මතවාද වලිනුත්, පරිසරය විනාශ කිරීමේ ක්‍රියාමාර්ග වලිනුත් මිදී රටෙහි පරිසර සංරක්ෂණ කලාප හා සංවර්ධන කලාප පූර්ව සැලසුමකින් යුතුව හඳුනා ගන්නෙමු. පරිසරය රැකීම සහ සංවර්ධනය එකනෙකට පසමිතුරු සංකල්ප නොව එකිනෙක හා බැඳුණු සංකල්ප බව පිළිගනිමු. බලශක්තිය නිපදවීමේදීත්, පරිභරණය කිරීමේදීත් එමගින් පරිසරයට වන හානිය සිහියේ තබාගෙන, පරිසරයට අවම ලෙස හානිවන මූලයන්ගෙන් රටට අවශ්‍ය බල ශක්තිය ලබාගැනීමට සැමවිට ම උත්සාහ කරමු. එසේ ම බලශක්තිය යනු රටක ප්‍රාණ නාලිය බැවින් කිසිදු විදේශීය බලවේගයකට රටේ ස්වාධීනත්වයට හෝ ආරක්ෂාවට බලපෑමක් ඇති කිරීමට ඉඩ නොතබන්නෙමු.

රාජ්‍යයක ධනවත් බව, බලය හා යහ පැවැත්ම එහි භෞතික වටාපිටාව මගින් ගම්‍ය වේ. නිවැරදිව සැලසුම් කළ, කාර්යක්ෂමව කළමනාකරණය කෙරෙන, එලදායි ලෙස භාවිත වන, භෞතික පරිසරයක් රටවැසියන්ගේ යහපත් දිවි පැවැත්මට, ආර්ථික සමෘද්ධියට හා දේශපාලන ස්ථාවරභාවයට මග සලසයි. එබැවින් විෂය ක්ෂේත්‍ර ප්‍රවීණයන් විසින් සම්පාදිත, ජාතික භෞතික සැලැස්මකට අනුකූලව, සංවර්ධන කාර්යයන් සිදු කිරීම අප විසින් සිදු කරනු ඇත. ඒ ජාතික භෞතික සැලැස්මට අනුගත වෙමින් ප්‍රවාහනය, විදුලි ජනනය, මාර්ග ඉදිකිරීම වැනි සංවර්ධන කටයුතු ඒ ඒ ක්ෂේත්‍ර ප්‍රවීණයන් විසින් සිදු කරනු ඇත.

8 ප්‍රතිපත්ති

# ස්ථාවර ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යය

**අපි ප්‍රජාතන්ත්‍රවාදීහු වන්නෙමු. ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ සංකල්ප කුඩා වියේ සිට දරුවන්ගේ සිත් තුළට ඇතුළු කිරීමටත්, ඒ පිළිබඳව ජනතාව දැනුවත් කිරීමටත් අපි ක්‍රියාත්මක වන්නෙමු. විශ්ව සම්මුතීන් තුළ පිළිගත් මානව හිමිකම්, නන්වැදෑරුම් නිදහස, මහජන පරමාධිපත්‍යය උපරිම ලෙස ආරක්ෂා කරනා පුරවැසි ජනරජයක් තුළ රාජ්‍ය තහවුරු කිරීම අපගේ වෑයමයි.**

එසේ ම ස්ථාවර රාජ්‍ය ව්‍යුහයක් හා ස්ථාවර රාජ්‍ය පාලන තන්ත්‍රයක් නොමැතිව රට ඉදිරියට ගෙනයා නොහැකි බව අපේ අදහසයි. අපි ප්‍රායෝගික ව්‍යවස්ථා සංශෝධන කරමින්, ව්‍යවස්ථාවේ ප්‍රජාතන්ත්‍රවාදී ගුණය වැඩි කරන්නෙමු. ජනාධිපති ක්‍රමය ඇතුළු ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ සිදු කිරීම, රාජ්‍යයේ ස්ථාවරත්වය හා ප්‍රජාතන්ත්‍රවාදය සුරැකෙන පරිද්දෙන්, තුලනාත්මක ප්‍රවේශයක් ඔස්සේ සිදු කළ යුතුය. රටේ විධායකය හා ව්‍යවස්ථාදායකය ප්‍රජාතන්ත්‍රීකරණය කරන්නා සේ ම අන් සියලු මහජන ආයතන හා සංවිධාන ප්‍රජාතන්ත්‍රීකරණය කිරීම ද අත්‍යවශ්‍යය.

රටේ ප්‍රධාන ව්‍යවස්ථාධායකය සහ විධායකය ඇතුළු මහජන නියෝජන ආයතනවලට පත්වන ජනතා නියෝජිතයන් ආචාර ධාර්මික අතින් පොහොසත් වූ ද ඉහළ වෘත්තිකභාවයකින් හා වගකීමකින් යුතුව කටයුතු කරන දේශපාලන ප්‍රජාවක් බවට පරිවර්තනය කිරීම සඳහා අවශ්‍ය පියවර ගනිමු.

රටේ යුක්තිය පසිඳලන අධිකරණයෙහි ස්වාධීනත්වය උපරිම ලෙස තහවුරු කෙරෙන අතර යුක්තිය පසිඳලන අපක්ෂපාතීව හා කාර්යක්ෂමව සිදුකිරීමට අවශ්‍ය පියවර ගනු ලැබේ. එසේ ම රටට නොගැළපෙන යල්පැන ගිය නීති ප්‍රතිසංස්කරණය කිරීමටත් නීතිය පිළිබඳ දැනුම හා අවබෝධය ප්‍රමාණවත් පරිදි සාමාන්‍ය පුරවැසියන්ට ලබාදීමටත් පියවර ගන්නෙමු.

ප්‍රජාතන්ත්‍රවාදය අවභාවිත කරමින් අන් අයගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන්ට බාධා පැමිණවීමටත්, දේශය අස්ථාවර කිරීමත්, ජනතාව තුළ අසත්‍ය මත ප්‍රචාරය කිරීමටත්, ජාති, ආගම් බෙද වැපිරවීමටත්, ජන හා ආගමික කොටස් අතර ද්වේශය පැතිරවීමටත් තැත් කරන්නන්ට එරෙහිව පවතින නීති තදින් ක්‍රියාත්මක කරනු ඇත. ප්‍රජාතන්ත්‍රවාදය අවභාවිත කරන්නන්ට එරෙහිව දැනට පවත්නා නීති ප්‍රමාණවත් නොවේ නම්, පාලකයන් ආරක්ෂා කිරීමට නොව, රටේ සහ ජනතාවගේ පොදු යහපත උදෙසා නව නීති ගෙන ඒමට අපි නොපැකිළෙමු.

අප රටේ ජාතික, ආගමික, සංස්කෘතික බහුවිධතාව අප පිළිගන්නා අතර සියලු පුරවැසියන් බහුවිධ ප්‍රජාතන්ත්‍රවාදයේ සාධනීය හවුල්කරුවන් ලෙස දිරිමත් කරමින් රාජ්‍යයේ ස්ථාවරත්වය රැකෙන ආණ්ඩුක්‍රම ව්‍යුහයක් සකස්කරගත යුතු බව අපි විශ්වාස කරමු. එහිදී මධ්‍යයේ බල හවුල්කාරීත්වය, විශේෂ නියෝජනය, ප්‍රාදේශීය පාලනය වැනි මූලධර්ම තුලනාත්මක ප්‍රවේශයක් ඔස්සේ ප්‍රයෝජනයට ගත යුතුය. මෙහිදී එකී මූලධර්ම මත, මේ වනවිටත් අප රටේ

ව්‍යවස්ථාපිතව, කලක් තිස්සේ ක්‍රියාත්මක වන යහපත් ව්‍යවස්ථා විධිවිධාන වලට එකඟවෙමින් ඒවා රැකීමට පොරොන්දු වෙමු.

## සංස්කෘතික පුරවැසියා ගොඩනැගීම

සමාජයක හෝ සමාජ කණ්ඩායමක අනන්‍යතාව පෙන්නුම් කරන භාවමය බුද්ධිමය, භෞතිකමය සහ ආධ්‍යාත්මික සියල්ලෙහි සංකීර්ණ සුවිශේෂත්වය සංස්කෘතියයි. අප සමාජය සතුව සංස්කෘතික ශක්තියක් ඇතිවා සේ ම සමාජය පෙළන සංස්කෘතික ගැටලු රැසක් ද පවතී. සංස්කෘතිය මතුපිට අර්ථයෙන් තේරුම් ගැනීම, සංස්කෘතික මූලධර්මවාදය, සංස්කෘතික ප්‍රචණ්ඩත්වය, සංස්කෘතික සාධකය කෙරෙහි දක්වන ආන්තික මට්ටමේ පිළි ගැනීම, සංස්කෘතික විරෝධය සහ සංස්කෘතිය ප්‍රවර්ධනය කෙරෙහි රාජ්‍ය දක්වන දෙවන පන්තියේ සැළකිල්ල මේ ගැටලු අතර ප්‍රධාන ය.

මේ ගැටලු පියමං කරමින් අපගේ සංස්කෘතික උරුමයේ සාධනීය අංග සංරක්ෂණය කරමින් අවශ්‍ය කරන්නා වූ සංස්කරණයන්ට විවෘත වෙමින් දියුණු සංස්කෘතික ජීවිතයක් පුරවැසියාට අත්පත් කරදීමේ ප්‍රධාන ක්‍රියාමාර්ගය ලෙස සංස්කෘතික මිනිසා ගොඩනැගීමේ කාර්යයට ජාතික ප්‍රමුඛත්වයක් හිමි විය යුතුය.

සංස්කෘතික මිනිසා යන්නෙන් තමන්ගේ සංස්කෘතිය ගෞරවයෙන් ආරක්ෂා කරන අතර, එය විචාරාත්මකව පරීක්ෂාකර අවශ්‍ය කරන සංස්කරණයන්ට විවෘත වන්නාවූ ද, අනෙකාගේ සංස්කෘතියට ගරු කරන්නාවූ ද, සියලු විශිෂ්ට මානව සංස්කෘතික ජයග්‍රහණ සමග සුහද මට්ටමෙන් බැදීමට ශක්තියක් සහ විවෘතභාවයක් දක්වන්නාවූ ද, තමා ජීවත්වන සමාජයේ ආර්ථික දේශපාලන හා සාමාජික ක්‍රියාකාරකම් සඳහා භාවමය හා බුද්ධිමය අභිමානයකින් යුතුව සම්බන්ධ විය හැකි, මානව ගරුත්වය, සාධාරණත්වය හා නිර්ප්‍රචණ්ඩත්වය තම දෛනික ගුණාංග කරගත්, සතුටු සිතින් ජීවත් වන, ප්‍රජාතන්ත්‍රවාදී පුරවැසියෙක් අදහස් කෙරේ. මෙහිදී ජාතික සංස්කෘතික උරුමය, කලාව, සාහිත්‍යය, නිදහස් ජනමාධ්‍ය, ක්‍රීඩාව, විනෝදාස්වාදය යනාදී අංග පුරවැසි ජීවිත ඔප්නංවන වැදගත් පැතිකඩ ලෙස භාර ගනිමින් දියුණු රාජ්‍ය ප්‍රතිපත්තියක් ඔස්සේ ඒවා අභිවර්ධනය කිරීමට කටයුතු කරන්නෙමු.

# 9 ප්‍රතිපත්ති

# සමාජ සාධාරණත්වය

**අප තනනු ලබන්නේ සමාජ සාධාරණත්වය හා සමානාත්මතාවය මත පදනම් වූ රටකි.**

අප රටෙහි මුළු ජනගහනයෙන් 76% සිංහලයන් බව ද, 71% බෞද්ධයන් බව ද යථාර්ථයකි. මේ ජන කොටස වසර දෙදහසකට වැඩි කලක් තිස්සේ අප දිවයින තුළ බහුතර ජනකොටස ලෙස ජීවත්වෙමින්, එය තුළ නොමැකිය හැකි සංස්කෘතියක් ගොඩනැගූ බව අමතක කළ නොහැකි ය. එසේ ම ඔවුන් සමග දිගු කලක් දෙමළ, මුස්ලිම්, බර්ගර්, ආදිවාසී ජාතිකයන් හා හින්දු, ඉස්ලාම්, කතෝලික, ක්‍රිස්තියානි ලබ්ධිකයන් එක් ව ජීවත්වූ බව ද සත්‍යයකි. ඉතිහාසයේ වැඩි කලක් මේ සියලු ජන කොටස් මේ දිවයින තුළ එකිනෙකා හා බැඳෙමින්, මිශ්‍ර වෙමින් සාමකාමීව ජීවත් වූහ. අප ඉස්මතු කරන්නේ මේ සියල්ලන් අතර වැඩි කලක් පැවති මේ සමගිය මිස, සුළු කලක් පැවති අසමගි කම් නොවේ. විවිධ ජාතීන්, විවිධ සාමයිකයන් වසන රටක් ඒ ඒ ජාතිකයන් හා සාමයිකයන් අතර අසමගිය වපුරුවා දියුණු කළ නොහැකි බව අපි මැනවින් වටහාගෙන සිටිමු . ජාතික හා සාමයික විවිධත්වය අගය කරමින්, ඔවුනොවුන්ගේ අනන්‍යතාව සුරකින අතර ම, මේ සියල්ලන්ම අප මවුබිම තුළ එක හා සමාන අයිතීන් ඇති පුරවැසියන් බව අපි තරයේ විශ්වාස කරමු.

රට තුළ ජනවාර්ගික හා සාමයික කණ්ඩායම් අතර ඇති විවිධත්වය අගය කරන අපි යම් ජනවර්ගයකට හෝ සමයකට අයිති වීම නිසා කිසිම පුරවැසියෙකුට අසමාන ලෙස සැලකීම හෙළා දකිමු. යම් ජනවර්ගයකට හෝ සමයකට අයිතිවීම නිසා අපේ රටේ යම් පුරවැසියෙකුට අසමානතාවක්, නොසැලකීමක් සිදුවුවහොත් එවැනි දෑ කරන්නන්ට විරුද්ධව ප්‍රබල නීති රීති මගින් කටයුතු කරනු ඇත. අනෙක් අතට තම වර්ගය හෝ සමය පදනම් කරගෙන අන් වාර්ගිකයන් හෝ සාමයිකයන් පෙළීමට හෝ විනාශකිරීමට තැත් කරනන් රටෙහි සාමය නැති කරන්නන් සේ අවබෝධ කර, එවැන්නන්ට විරුද්ධව නීතිය උපරිම ලෙස යෙදවීමට ද කටයුතු කරන්නෙමු. අප රටේ ඕනෑම ජනවර්ගයකට හෝ සමයකට අයිතිවන අයෙකුට රටෙහි මූලික පුරවැසියා වීමට ඇති අයිතිය අපි පිළිගනිමු.

ධනෝත්පාදන රාජ්‍යයක ආර්ථික ක්‍රියවලිය, සමාජයේ ගැඹුරු විෂමතාවන් ඇති නොවන පරිදි නියාමනය කරමින් හා හසුරුවමින්, ආර්ථික වශයෙන් හා අනෙකුත් ආකාරයන්ගෙන් ආන්තිකකරණයට ලක්වන්නා වූ කොටස් විශේෂයෙන් රැකබලාගන්නා වූ ඉලක්කගත වැඩසටහන් හඳුන්වා දෙන්නෙමු.

තරුණයන් යනු සියලු පුරවැසි අයිතීන් ඇති වැඩිහිටියන් බව අපි විශ්වාස කරමු. ඕනෑම තරුණයෙකුට තම වයස, හෝ ජ්‍යෙෂ්ඨත්වය සාධකයක් නොකර ගෙන තම කුසලතාවන්ට ගැළපෙන ඕනෑම තනතුරක් හෝ වගකීමක් දැරීමට හැකි රටක් අපි තනන්නෙමු.

එසේ ම ආබාධිත, වෙනස් හැකියාවන් ඇති, ජීව විද්‍යාත්මක හා මානසික සාධක මත ලිංගිකත්වය පිළිබඳ වෙනස්කම් ඇති සියල්ලන් ම අප රටේ අන් පුරවැසියන් සේ ම සමාන අයිතිවාසිකම් ඇති අය සේ සැළකීම අපේ ප්‍රතිපත්තියයි. මේ අය අන් සියලු පුරවැසියන් සේ ම රට ගොඩ නැගීමට දායකත්වය ලබාදෙන්නන් බවට පත්කිරීම අපගේ අභිප්‍රායයි.

පුරුෂ මූල ආධිපත්‍යයික සමාජයක කාන්තාවන්ට සිදුවන අසාමානතා හා ප්‍රචණ්ඩකාරී සැලකීම් හරයාත්මකව වෙනස් කිරීමට අපි කැපවෙමු. කාන්තා ගරුත්වය සහතික කිරීම අතින් සමාජයක් ලෙස අප ඇතැම් ජයග්‍රහණ ද ලබාගෙන තිබෙන බව පිළිගනිමු. අප රටේ පැවතියේ කාන්තාවට ගරු කරන සංස්කෘතියකි. රටේ ඉහළම තලයේ පදවි හොබවන්නටත්, විවිධ ක්ෂේත්‍රවල පිරිමින් හා සමව දස්කම් දැක්වීමටත් අපේ කාන්තාවෝ සමත් වූහ. මේ සියලු දස්කම් අතර දේශපාලන භූමිකාවෙන් කාන්තාවන් ඉවත් කිරීමට එයට අරක්ගෙන ඇති අශීලාචාර දේශපාලකයෝ අතළොස්සක් සමත් වූහ. මේ දුෂ්ට දේශපාලන භූමිකාව පරාජය කිරීමටත්, කාන්තාවන්ට දේශපාලන බිමේ සහ පොදු සමාජයේ සිදු කරන නින්දා අපහාස, අඩන්තේට්ටම් වලට එරෙහිව නීතිය තදින් ක්‍රියාත්මක කිරීමටත් අපි සපථ කර සිටිමු. ආර්ථික, දේශපාලන හා සංස්කෘතික භූමිකාව තුළ කාන්තාවන්ට හිමිවිය යුතු සමාන අවස්ථා තහවුරු කිරීමට කටයුතු කරන්නෙමු.

අද අප රටෙහි උපතේ සිට මරණය දක්වා බොහෝ කටයුතු දේශපාලන බලපෑමකින් හෝ අල්ලස් මගින් හෝ අනිසි බලපෑමකින් තොරව කරගත නොහැකි ය. මේ තත්ත්වය සමාජ සාධාරණත්වයේ මූලික පදනමට විරුද්ධ ය. මෙයට විසඳුමක් ලෙස සියලු පුද්ගල කටයුතු අනීතික බලපෑම්වලින් මුදාගැනීමට අවශ්‍ය නවීන නීති රීති හා නවීන තාක්ෂණය අපි හඳුන්වා දෙන්නෙමු. මේ සඳහා පෙරකී පරිදි රාජ්‍ය සේවය නවීකරණය කොට, ඒකාග්‍ර කොට, කාර්යක්ෂම කිරීමේ දුෂ්කර, එනමුත් අත්‍යවශ්‍ය කර්තව්‍යය කරන්නෙමු.

අප තනන්නේ සියලු පුරවැසියන්ගේ අයිතීන් සමානව සුරකින රටක් නිසා එවැනි රටක ඕනෑම අයෙකුට ජනවර්ගය හෝ ආගම හෝ කුලය හෝ ලිංගිකත්වය හෝ වයස මත හෝ නොව කුසලතාව මත ඉදිරියට විත් රාෂ්ට්‍ර පාලනයේ ඉහළට ගොස් රටේ මුල් පුරවැසියා බවට පත්වීමට හැකි දේශයක් තැනීම අපේ පරම චේතනාවයි.

ප්‍රතිපත්ති

# 10 සමමිතුරු විදේශ ප්‍රතිපත්තිය හා ජාතික ආරක්ෂාව

**මෑත කාලයේදී පාලකයන් විසින් අනුගමනය කළ අදූරදර්ශී විදේශ ප්‍රතිපත්ති හා වංචනික හැසිරීම් නිසා අප රට අද බලවත් රටවල බල අරගලයේ කේන්ද්‍රයක් වී ඇත. මේ තත්ත්වයෙන් මිදීමට නම් අප මේ කිසිදු රටක සතුරකු නොවන සම මිතුරු විදෙස් ප්‍රතිපත්තියක් අනුගමනය කළ යුතුය. ආර්ථික වශයෙන් දුර්වල වී ඇතත්, කුඩා දිවයිනක් වන අප රට ඉන්දියානු සාගරයේ පිහිටා ඇති ස්ථානය නිසා එයට ඇති භූ දේශපාලනික වැදගත්කම අති මහත් ය. මෙය අවාසියට නොව ආර්ථික හා දේශපාලනික වාසියකට හරවා ගැනීම අපේ අභිප්‍රායයි.**

විදේශ ප්‍රතිපත්තිය නැණවත් ව හැසිරවීම අප රටේ ආරක්ෂාව නිසි ලෙස රැකගැනීමේ මූලික ම අඩිතාලම වෙයි. කවර දුරදර්ශී විදේශ ප්‍රතිපත්තියක් තිබුණ ද, රටකට දේශීය හා විදේශීය ආරක්ෂාව සඳහා ආරක්ෂක අංශ අත්‍යවශ්‍ය අංගයක් වේ. එ නමුදු දැන් අප රටේ හමුදාව අපේ ආර්ථික ශක්තියට ගැළපෙන ප්‍රමාණයට සැකසීමේ අවශ්‍යතාවක් පැන නැගී ඇත. දැනට තිබෙන ආරක්ෂක හමුදාවන් නිර්-දේශපාලනීකරණය කිරීමත්, පවතින හමුදාවට නවීන දැනුම ලබාදී ඔවුන් නව සොයාගැනීම් සහ නිපැයුම් වලට යොමු කිරීමටත් අපි කටයුතු කරන්නෙමු. අප රට වටා සුවිසල් ගගන තලයක් හා සමුදුරක් ඇති හෙයින් අදට වඩා ප්‍රබල නාවුක හමුදාවක් හා ගුවන් හමුදාවක් ගොඩනැගීමට කටයුතු කරමු.

සුහුරු තාක්ෂණය මත පදනම්වූ ආරක්ෂක ක්‍රමවේද මගින් බුද්ධි තොරතුරු ගවේෂණය කිරීමත්, නිරන්තරයෙන් ආරක්ෂක ක්‍රමවේද නවීකරණය කිරීමත්, සෑම විදේශ රටක රාජ්‍ය බුද්ධි අංශ සමග බුද්ධි තොරතුරු හුවමාරු කර ගැනීමත් රාජ්‍ය ආරක්ෂාවේ අත්‍යවශ්‍ය අංග වේ. මේ සියල්ල සිදුකිරීමට අප රටට සමමිතුරු විදේශ ප්‍රතිපත්තියක් තිබීම අත්‍යවශ්‍ය පූර්ව කොන්දේසියක් වේ.

**රට ගොඩනැගීමේදී**
**මේ පංචවිධ වටිනාකම් හා පංචවිධ ප්‍රතිපත්ති**
**එකිනෙකට බැඳී පවතී.**
**ඉන් එකක් හෝ දුර්වල වූ විට එය අනෙකකට බලපායි.**
**මේ බව සිත්හි දරා, මේ සියල්ල පෝෂණය කරමින්**
**අප ගොඩනගන රට, ස්ථාවර සෞභාග්‍යවත්,**
**ධනවත් රාජ්‍යයක් බවට පත් කළ හැකි යැයි**
**අපි විශ්වාස කරමු.**

# ඇරයුම

අප රටේ දේශපාලන පක්ෂ බොහෝ තිබේ. මේ බොහෝ දේශපාලන පක්ෂවලට ද, ඒවායේ නායකත්වයට ද දැඩි ජනතා අප්‍රසාදයක් එල්ලවී ඇත. ඒ, අද අප රට වැටී තිබෙන සමාජ, දේශපාලන, ආර්ථික අර්බුදයේ නිර්මාතෘවරුන් මොවුන් බව ජනතාව වටහා ගෙන ඇති නිසාය.

පවතින අර්බුදය හමුවේ ජනතාවගේ ගැලවුම්කරුවන් ලෙස පෙනී සිටීමට පැරණි හා නව දේශපාලන පක්ෂ ද ඉදිරිපත්ව ඇත. සිදුවූ දේ නිර්දය ලෙසත්, අලංකාරවත් විවේචනය කොට වරදකරුවන්ට දඬුවම් කිරීමට පොරොන්දුවීමෙන් ඔබ්බට ගොස් රට හදන වැඩපිළිවෙළක් ඉදිරිපත් කිරීමට මේ ගැලවුම්කරුවන් අසමත්ව ඇත.

එක්සත් ජනරජ පෙරමුණ, ඔබ හමුවට එන්නේ තවත් එක් දේශපාලන පක්ෂයක් ලෙස නොවේ. එක්සත් ජනරජ පෙරමුණට ඔබට නොසඟවා, නොපැකිලව ඉදිරිපත් කළ හැකි දේශපාලන දර්ශනයක් ඇත. එක්සත් ජනරජ පෙරමුණට සියලු ක්ෂේත්‍ර ආවරණය වන රට පෙරට රැගෙන යන නවීන ඉදිරිගාමී වැඩ පිළිවෙළක් ඇත. එක්සත් ජනරජ පෙරමුණට අවංක, කුසලතාවෙන් ඉදිරියට ආ, තම කාර්යශූරත්වය වචනයෙන් නොව ක්‍රියාවෙන් පෙන්වූ නායකත්වයක් ඇත.

පරිපූර්ණ දර්ශනයකින්, ඉදිරිගාමී වැඩ පිළිවෙළකින්, කාර්යශූර නායකත්වයකින් හෙබි එක්සත් ජනරජ පෙරමුණ ඔබ සොයමින් සිටින පක්ෂයයි. වැටුණු රට හදන පක්ෂයයි. එය ඔබේ හිමිකාරිත්වය, දායකත්වය හා සහයෝගය මත, වැටුණ රට ගොඩනැගීමේ අභියෝගය නිර්භීතව භාරගන්නා දේශපාලන පක්ෂයයි.මේ පක්ෂය අයිති ඔබටයි. මෙය ඔබේ පක්ෂයයි.

**එක්වෙමු, වැඩකරමු**

**හදමු, අපේ රට**

# ප්‍රණාමය

මේ ප්‍රතිපත්ති මාලාව සැකසීම සඳහා මානව සමාජයේ යහපත වෙනුවෙන් කැපවුණ ඉදිරිගාමී වියතුන් වෘත්තිකයන, සමාජ ක්‍රියාකාරිකයන් හා සංවිධාන විසින් ඉස්මතු කරන ලද සමාජ සංවාද වල සහ ශාස්ත්‍රීය ලේඛනවල ආලෝකය අපි ලබාගත්තෙමු.

ඒ සියලු පුරෝගාමී පුරවැසියන්ට හා සංවිධානවලට අපගේ ප්‍රණාමය පිරිනමමු.

# සටහන්...

එක්සත් ජනරජ පෙරමුණ

කොළඹ 5, ඇන්ඩර්සන් මහල් නිවාස, අංක W2/3 හි පදිංචි, කරු පරණවිතාන වන මා විසින්
2023 මැයි මස 22 වැනි දින, එක්සත් ජනරජ පෙරමුණ වෙනුවෙන් කොළඹ දී මුද්‍රණය කොට ප්‍රකාශයට පත්කරන ලදි.